# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2019

2023 දෙසැම්බර්

මානවශාස්ත්‍ර පීඨය

සිංහල (පැරණි නිර්දේශය)

භාෂා පරිණාමය, පුරාක්ෂර විද්‍යාව හා කලාශිල්ප **SINH – E3025**

පළමුවන ප්‍රශ්නය ද දෙවන හා තෙවන කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් ද තෝරාගෙන ප්‍රශ්න **පහකට** (05) පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

## <u>1 කොටස</u>

01. පහත සඳහන් ශිලා ලේඛන පාඨයන්හි අදහස ලිහිල් බසින් ලියන්න.

අ) පරුමක - වෙශමණ - පුත - බරණිය ලෙණෙ දෙවහ ච
චතුදිශ - ශගශ

කණගම රඨබහ තිශහ කිතිත ශවෙර - ශමණි ලෙණෙ

දෙවනපිය-මහරඣහ බරියය බකිනිය උපශික - වරුණදතය
ලෙණ

පරුමක නමලි - ශුමන- පුත - පරුමක - නමලිය ලෙණෙ
නමලිය ලෙණෙ ශගශ

පරුමක - නග - පුත - අසලිය ලෙණෙ අගත - අනගත
-චතු - දිසික සගයෙ

(ලකුණු 10 යි)

ආ) සිරිසගබො උදා ම
හරදහු තුමා සත් ලැ-
ගු දෙවන හවුරුදු-
-යෙහි නිකින්නි ස (ඳ)
අව විසෙනියි සොර-
බරහි ආවූ හොපිටි
ගමුපදියැ වැපාර(ය)-
-න් කුඩින් වත්හිමිය(න්)-
-වහන්සෙ මියගුණුමහ-
වෙර වැඩි කලැ ගි-
-ය දවසැ පදිලද් ද-
-ඩනායකයන් ගැත්ත-
-න් සතලොසැ පිරිනිවි-

යත්වහන්සෙ දවසැ
කළ වැවස්ථා ඉක්මැ අ-
-න්නැයෙන් දඩ ගත්හ
නොසිරිත් පඬුරු ග
-ත්හ ගමින් වියෙයි
-සි වැඩිතැනැ දැන්වූ-
-තැනින් සතළොසැ (ව
-හන්සෙ) දවසැ කළ සිරි
-තක් මිසැ අන්නැයෙන්
කරන දැයක් නො කරන්-
නෙයැ යි සබ වැවස්(ථා)-
-වක් ලියවා තබ(න්නෙ)
-යි වදාළෙන් සභායෙ
ලෙකම්ගෙහි සම්ද(රු)
-වන් හි(඲ැ සි)ට්වූ වැව-
-ස්ථා සිරිති

(ලකුණු 10 යි)

ඇ) උන්ද්වප් සන්ද් පෙරෙ අඩ් (ම)ස්හි ද(ස)
පක් දවස් උතුරු පසැ අම්ගම්කුළියෙහි කිබි(නිල)
මිහි දෙමෙළ්වෙහෙර පමණියෙන් දසගමට් එකෙක
නායකයන් කිබ්ගම් ඇප දූන් නායකයන් කුඩී
න් මෙහි ඇතුළත්තාක් තැනැ කුහිවකු මරා කෙ(ටුව)
කඬපළා සොරකම් කළ තිරැ කොට් ගෙනැ දස ගැමැ ඇ
ත්තන් හින්දැ විචාරා උපන් දැයට් පෑ හැකිසේ ලියා
තබා මැරුවෙහු මරා පට්වනු කොට් ඉසා කඬපළා සොරු
න් ගත් අයතියෙන් නියතකළාක් අයිතිය (හි)මි
-හට් ගෙන දී එල්වනු කොට් ඉසා තිරැ නොකළ දසගැ
මැ ඇත්තන් පන්සාලිස දවසෙකින් සොයා ගෙනැ පට්
වනු කොට් ඉසා

(ලකුණු 10 යි)

ඈ) රජ් මහ වෙහෙර්හි ඉසා පිරිවෙන්හි ඉසා පියන්ගල්හි ඉසා
මෙහෙණිවර්හි ඉසා සඟ් සතු පුගුල් සතු ලාභ
යෙහි ඉසා බප් තුවාක් ගම් බිමට් රජ්කොල්කැමියන් වැදැ
වැරියන් ගැල් ගොන් මීවුන් නොගන්නා ඉසා ගස්කො
ළ් නොකපනු ඉසා මෙලාට්සී නොවද්නා ඉසා
මිනිකෙටුකෙනෙකුන් ඇත ගමට් වැදූ ඔවුන්මැ ඉල්ලත් මුත්
සෙසු
එහි නොපහළ් සෙසුකුඩිනට් අනියා නොකරනු ඉසා
දෙදෙහවුරුද්දෙන් ගොස් රජ්කොල්සම්දරුවන් රට් ඉල්ලා
(පස්) මහාසාවද්දූ වරප් ඉල්ලත්මුත් සෙසුවරද් නොඉල්ලනු
ඉසා පෙරෙකැමියන් ගම් දන්නා සෙ දඩ් ගෙනැ
පැට්වූ වරදට් වටාලා දඩ් නොගන්නා ඉසා ඇත්වෙහෙරැ
ගම්බිමින් ගත් හැමදඩ් ඇත්වෙහෙරැ කම්න
වාමට් දෙනු ඉසා පෙර නොවන් විරී තැනට් පෙරෙනාට්ටියම්
නොවද්නා ඉසා රට් පටවන්නට් ගිය රජ් කොල්
සම්දරුවන් ගත් දඩැ ගිගිරියක් ඇත සම්දරුවන්
දඩනායකයන් හිඳූ විචාරකොට් හැරියැ යුතුවක්
හර්නා ඉසා මිනීකොටා සඟුන් වන් තැනට් වන් කෙනෙකුන්
ඇත එහි පහළවනුද් ඔවුනුප් විචාර කොට් දම්බි
දිව් යවන්නට් හර්නා ඉසා

(ලකුණු 10 යි)

### නැතහොත්

පහත සඳහන් ශිලා ලිපි කියවා වර්තමාන සිංහල අකුරෙන් ලියන්න.



(ලකුණු 10 යි)

## II කොටස

02. ආරම්භක අවධියේ ලෙන්ලිපිවලින් අනාවරණය කරගත හැකි අතීත ලංකාවේ ආගමික හා සමාජ තොරතුරු පිළිබඳ සමාලෝචනයක් කරන්න.

03. 'තෝණිගල ගිරි ලිපිය අතීත ලංකාවේ වැදගත් සමාජ පැතිකඩක් හෙළි කරයි.' විමසන්න.

04. ඓතිහාසික බදුලු ටැම්ලිපියෙන් හෙළි කරගත හැකි 10 වන සියවසේ ක්‍රියාත්මක වූ වෙළෙඳ නීතිරීති මොනවාදැයි පැහැදිලි කරන්න.

### නැතහොත්

'වේවැල්කැටිය පුවරු ලිපිය අතීතයේ පැවති අපරාධ මර්දන ක්‍රියාදාමය හඳුනාගැනීමට මනා නිදසුනකි.' විමසන්න.

05. පහත සඳහන් මාතෘකා අතරින් එකකට ප්‍රාමාණික සටහන් ලියන්න.

- ආ) සිංහල ප්‍රාකෘත අවධිය
- ආ) මධ්‍යතන සිංහල අවධියේ විශේෂ භාෂා ලක්ෂණ
- ඇ) නූතන සිංහලයේ යුරෝපීය භාෂා බලපෑම
- ඈ) සිංහලයේ ද්‍රවිඩ භාෂා ලක්ෂණ

## III කොටස

06. කලාශිල්ප විෂය ක්ෂේත්‍රය පිළිබඳ මූලික හැඳින්වීමක් කරන්න.

07. මහින්දාගමනයෙන් උදා වූ බෞද්ධ සංස්කෘතික ප්‍රබෝධය ශ්‍රී ලංකාවේ කලාශිල්ප ප්‍රවර්ධනයෙහි ලා හේතු වූ ආකාරය පරීක්ෂා කරන්න.

08. ප්‍රභවය හා විකාසනය කෙරෙහි සාවධාන වෙමින් බෞද්ධ ස්තූප කලාව පිළිබඳ හැඳින්වීමක් කරන්න.

09. ''බුදුපිළිමය ලාංකේය ප්‍රතිමා ශිල්පියාගේ අග්‍රගණ්‍ය නිර්මාණයකි.'' සාකච්ඡා කරන්න.

10. මහනුවර යුගයේ සිතුවම් කලාවේ අනන්‍යතාව පිළිබඳ විවරණයක් කරන්න.

(02 වන පිළිතුරේ සිට 10 වන පිළිතුර දක්වා සෑම පිළිතුරකට ම ලකුණු 15 බැගිනි.)

*************************************